# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/8 - 2019 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2019.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමග කියවිය යුතු 3 වගන්තිය යටතේ වූ නියමය.

නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරන (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත උපලේඛනයේ මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 62.583 ක විශාලත්වයෙන් යුතු කටගමුව දෙමැද වනාන්තරය වර්ෂ 2019 ක් වූ මාර්තු මස 18 වැනි දින සිට කටගමුව දෙමැද රක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි කටගමුව වනාන්තරයට අයත් කටගමුව ගමේ අ.ග.පි. 2969 හි කැබලි අංක 375, 376, 378, 379, 381, 382, 383 හා 384 හම්මිල්ලෑව ගමේ අ.ග.පි. 2966 හි කැබලි අංක 450, 451, 453, 454, 456, 457, 458 හා 459 ලෙස හඳුන්වන වාන්ඇලයාය, දෙමැදේකැලේ, කෝන්ගහමුලයාය, දඹගහමූකලාන, මෝදරමුල්ලේහේන, කැප්පෙටියාවහේන, කෝන්ගහමුලහේන, දෙමැදකැලේ සහ මණ්ඩකාලියේදූව නමැති ඉඩම් ඒකාබද්ධ වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 62.583 ක් වූ විශාලත්වයෙන් යුතු (අ.ග.පි. 2969 කැබලි අංක 67(පිටඹය), කැබලි අංක 377(පාර), කැබලි අංක 380 (පාර), කැබලි අංක 69 (ඇල), අ.ග.පි. 2966 හි කැබලි අංක 125 (පිටඇල), කැබලි අංක 452(පාර) සහ කැබලි අංක 455(පාර) හැර) රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 2969 දරන කටගමුව ගමේ කොටසක් සහ අ.ග.පි. 2966 හම්මිල්ලෑව ගමේ කොටසක් ; |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 2964 දිවුල්ලෑව ගම සහ අ.ග.පි. 2966 හි කැබලි අංක 127 දරන දැදුරු ඔය සහ අ.ග.පි. 2969 හි කැබලි අංක 71 දරන දැදුරුඔය ; |
| *දකුණට* | : | අ.ග.පි. 2966 හි කැබලි අංක 127 සහ අ.ග.පි. 2969 හි කැබලි අංක 71 දරන දැදුරුඔය ; |
| *බටහිරට* | : | අ.ග.පි. 2969 කටගමුව ගමේ කොටසක් සහ අ.ග.පි. 2966 හම්මිල්ලෑව ගමේ කොටසක්. |
| *ප්‍රමාණය* | : | හෙක්. 62.583 |

04 - 727

1A - PG 4465 — 242 (2019/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*